Lesson 09 **සාමාන්‍ය ක්‍රියා - තවත් උදාහරණ**

අපි පසුගිය පාඩමේදි ඉගෙන ගත්තෙ සාමාන්‍ය ක්‍රියාවන් ප්‍රකාශ කරන ආකාරය සහ එහි නැතාර්ථය සහ ප්‍රශ්නාර්ථය.
මෙම පාඩමේදී ඊටම අදාළව ඔබට ඉතාම ප්‍රයෝජනවත් විය හැකි වාක්‍යය උදාහරණ ලෙස ලබාදෙනවා. මේවා ඉතාම ලස්සන වාක්‍යයන්. ඇතැම් විට ඒවායේ වෙනත් වාක්‍ය සහ ව්‍යාකරන රටාවන්ද සම්බන්ධව තිබිය හැකියි. ඒ සියල්ල හොදින් අධ්‍යනය ඒවා කර ඔබේ භාවිතයට එක් කරගන්න උත්සාහ කරන්න

We normally take bread for breakfast
වි නෝමලි ටේක් බ්‍රෙඩ් ෆෝ බ්‍රෙක්ෆස්ට්
අපි සාමාන්‍යයෙන් උදේට කෑමට ගන්නේ පාන්

I take a light meal for dinner
අයි ටේක් අ ලයිට් මීල් ෆෝ ඩින(ර්)
මම රෑ කෑමට ගන්නේ සැහැල්ලු ආහාරයක්

This land belongs to my father
දිස් ලෑන්ඩ් බිලෝංග්ස් ටු මයි ෆාද(ර්)
මේ ඉඩම අයිති මගෙ තාත්තට

He owns a big estate
හී ඕන්ස් අ බිග් එස්ටේට්
ඔහුට ලොකු වත්තක් අයිතියි
(මෙහිදී belong සහ own කියන ක්‍රියා පද දෙක යෙදී ඇති ආකාරය සැලකිල්ලට ගන්න )

Do you own this land?
ඩු යූ ඕන් දිස් ලෑන්ඩ්?
ඔයාට මේ ඉඩම අයිතිද?

It rains hard here
ඉට් රේන්ස් හාඩ් හිය(ර්)
මෙහෙ හයියෙන් වහිනවා

You owe me 500
යූ ඕ මී ෆයිව් හන්ඩ්‍රඩ්
ඔයා මට පන්සීයක් ණයයි (owe - ඕ - නයව සිටිනවා)

They charge 500 for one session
දේ චා(ර්)ජ් ෆයිව් හන්ඩ්‍රඩ් ෆෝ වන් සෙෂන්
ඔවුන් එක වාරයකට පන්සීයක් අය කරනවා

I know him quite well
අයි නෝ හිම් ක්වයිට් වෙල්
මම ඔහුව හොදට දන්නවා (මෙහි quite කියන වචනෙන් ඒ සමග යෙදෙන අනිත් වචනයේ තේරුම උද්දීපනය වෙනවා)

You look tired
යූ ලුක් ටය(ර්)ඩ්
ඔයාට මහන්සි පාටයි(ඔයාට මහන්සියි වගේ පේනවා)

He looks angry
හී ලුක්ස් ඇංග්‍රි
ඔහුට කේන්තියි වගේ

I go to sleep very late
අයි ගෝ ටු ස්ලීප් වෙරි ලේට්
මං නිදාගන්න යන්නේ ගොඩාක් රෑ වෙලා

He gets up very early
හී ගෙට්ස් අප් වෙරි අ(ර්)ලි
ඔහු ගොඩක් උදෙන් නැගිට්නවා

He looks like his father.
හී ලුක්ස් ලයික් හිස් ෆාද(ර්)
ඔහු ඔහුගෙ තාත්ත වගෙයි (පෙනුම)

We grow old day by day
වී ග්‍රෝ ඕල්ඩ් ඩේ බයි ඩේ
අපි දවසින් දවස වයසට යනවා

They make so much noise
දේ මේක් සෝ මච් නොයිස්
ඔවුන් ගොඩක් සද්ද කරනවා

I don't lie
අයි ඩෝන්ට් ලයි
මම බොරු කියන්නෙ නෑ (lie - බොරැ කියනවා)

I don't cheat people
අයි ඩෝන්ට් චීට් පීපල්
මම මිනිස්සුන්ව රවට්ටන්නේ නෑ (cheat - රවටනවා/ වංචා කරනවා )

I don't understand why you do this
අයි ඩෝන්ට් අන්ඩස්ටෑන්ඩ් වයි යූ ඩු දිස්
මට තේරෙන්නෙ නෑ ඇයි ඔයා මේක කරන්නේ කියල

This doesn't work properly
දිස් ඩස්න්ට් ව(ර්)ක් ප්‍රොප(ර්)ලි
මේක හරියට වැඩ කරන්නේ නෑ

Buses run every 15 minutes on this road
බසස් රන් එව්රි ෆිෆ්ටීන් මිනිට්ස් ඔන් දිස් රෝඩ්
හැම මිනිත්තු 15 කට සැරයක් මේ පාරේ බස් දුවනවා

Our Boss doesn't allow us to leave early
අව(ර්) බොස් ඩස්න්ට් අලව් අස් ටු ලීව් අ(ර්)ලි
අපේ බොස් අපිට වේලාසනින් යන්න ඉඩ දෙන්නෙ නෑ

I don't think so
අයි ඩෝන්ට් තිංක් සෝ
මම එහෙම හිතන්නෙ නෑ

I don't hear you
අයි ඩෝන්ට් හියර්) යූ
මට ඔයාව ඇහෙන්නේ නැහැ

My mother doesn't allow it
මයි මද(ර්)) ඩස්න්ට් අලව් ඉට්
මගේ අම්ම එකට ඉඩ දෙන්නේ නැහැ

This machine doesn't work properly
දිස් මැෂින් ඩස්න්ට් ව(ර්)ක් ප්‍රොප(ර්)ලි
මේ මැෂින් එක හරියට වැඩ කරන්නේ නැහැ

I don't go out nowadays
අයි ඩෝන්ට් ගෝ අවුට් නව්අඩේස්
මම මේ දවස් වල එලියට යන්නේ නැහැ

We don't intend to sell this land
වී ඩෝන්ට් ඉන්ටෙන්ඩ් ටු සෙල් දිස් ලෑන්ඩ්
අපි මේ ඉඩම විකුනන්න අදහස් කරන්නේ නෑ (intend -ඉන්ටෙන්ඩ් - (යමක් කරන්න ) අදහස් කරනවා )

I don't believe what he says
අයි ඩෝන්ට් බිලීව් වට් හී සේස්
මම ඔහු කියන දේ විශ්වාස කරන්නෙ නෑ (මෙහි what කියන එකෙන් අදහස් වෙන්නෙ දෙය කියන එක)

I don't care what others say
අයි ඩෝන්ට් කෙයා වට් අද(ර්)ස් සේ
මම අනිත් අය කියන දේවල් ගණන් ගන්නේ නෑ

We don’t stay up after 10
වී ඩෝන්ට් ස්ටේ අප් ආෆ්ට(ර්) ටෙන්
අපි දහයෙන් පස්සේ ඇහැරිලා ඉන්නේ නැහැ

I don’t remember
අයි ඩෝන්ට් රිමෙම්බ(ර්)
මට මතක නැහැ

Does she agree with you?
ඩස් ශී ඇග්‍රී විත් යූ ?
ඇය ඔබත් සමග එකග වෙනවද ?

Does your mother know about this ?
ඩස් යුව(ර්) මද(ර්) නෝ අබවුට් දිස් ?
ඔයාගේ අම්මා මේ ගැන දන්නවද ?

Don’t you come with us?
ඩෝන්ට් යූ කම් විත් අස් (විතස්) ?
ඔයා අපිත් එක්ක එන්නෙ නැද්ද ?

Why don’t you come with us?
වයි ඩෝන්ට් යූ කම් විත් අස්?
ඇයි ඔයා අපිත් එක්ක එන්නෙ නැත්තෙ?

Do you recommend this? I want to buy it
ඩූ යූ රෙකමන්ඩ් දිස්? අයි වොන්ට් ටු බයි ඉට් ටූ
ඔයා මේක අනුමත කරනවද ? (හොදයි කියලා ? ) මට ඒක ගන්න ඕන

Do you really want to go there?
ඩූ යූ රියලි වොන්ට් ටු ගෝ දෙයා?
ඔයාට ඇත්තටම අවශ්‍යද එහෙ යන්න?

This kind of incidents happen quite often
දිස් කයින්ඩ් ඔෆ් ඉන්සිඩන්ට්ස් හැපන් ක්වයිට් ඕෆ්න්
මේ වගේ සිද්දි නිතරම වගේ සිද්ද වෙනවා (often- නිතර. quite often- නිතරම වගේ)

This book contains some valuable information
දිස් බුක් කන්ටේන්ස් සම් වැලුවබල් ඉන්ෆොමේෂන්
මේ පොතේ වැදගත් තොරතුරු අඩංගු වෙනවා (contain- අඩංගු වෙනවා)

This box contains some jewellary
දිස් බොක්ස් කන්ටේන්ස් සම් ජුවලරි
මේ පෙට්ටියේ ආභරණ වගයක් අඩංගු වෙනවා

This machine consists of five parts
දිස් මැෂින් කන්සිස්ට්ස් ඔෆ් ෆයිව් පා(ර්)ට්ස්
මේ මැෂින් එක කොටස් පහකින් සමන්විතයි (consist- සමන්විත වෙනවා)

We all make mistakes at times
වී ඕල් මේක් මිස්ටේක්ස් ඇට් ටයිම්ස්
අපි හැමෝම අතින් වැරදීම් සිදුවෙනවා සමහර වෙලාවලට

We face many difficulties because of this problem
වී ෆේස් මෙනි ඩිෆිකල්ටීස් බිකෝස් ඔෆ් දිස් ප්‍රොබ්ලම්
අපි ගොඩක් දුෂ්කරතා වලට මුහුණ දෙනවා මේ ප්‍රශ්නය නිසා
(difficulty - දුෂ්කරතාව / බහු . difficulties )

I sometimes get late to work
අයි සම්ටයිම්ස් ගෙට් ලේට් ටු ව(ර්)ක්
මම සමහර වෙලාවට වැඩට යන්න පරක්කු වෙනවා (get late - පරක්කු වෙනවා )

I never get late to work.
අයි නෙව(ර්) ගෙට් ටු ලේට් ටු ව(ර්)ක්
මම කවදාවත් වැඩට යන්න පරක්කු වෙන්නේ නෑ (never-කවදාවත් නැහැ)

He never accepts his faults
හී නෙව(ර්) ඇක්සෙප්ට්ස් හිස් ෆෝල්ට්ස්
ඔහු කවදාවත් ඔහුගෙ වැරදි පිළිගත්තෙ නෑ (accept - පිලිගන්නවා)

They never help anyone
දේ නෙව(ර්) හෙල්ප් එනිවන්
ඔවුන් කවදාවත් කාටවත් උදව් කරන්නේ නෑ

- (ඉහත ආකාරයෙන් never යෙදුනම ඒ වාක්‍යය සෘන බවට හරවන්න අමුතුවෙන් do not, does not එකතු කරන්න අවශ්‍ය නැහැ. මොකද never කියන වචනයේ සෘන අර්ථය නැත්නම් නැතාර්ථය තිබෙන නිසා )

She argues with him a lot
ෂී ආගියුස් විත් හිම් අ ලොට්
ඇය ඔහුත් එක්ක ගොඩක් වාද කරනවා

I feel tired
අයි ෆීල් ටය(ර්ඩ්
මට මහන්සි දැනෙනවා (මට මහන්සියි)

Do you feel tired?
ඩූ යූ ෆීල් ටය(ර්)ඩ් ?
ඔයාට මහන්සි දැනෙනවද? (ඔයාට මහන්සිද ?)

I feel sorry for him
අයි ෆීල් සොරි ෆෝ හිම්
මට ඔහු ගැන කනගාටු හිතෙනවා (මට ඔහු ගැන දුකයි )

What does it mean?
වට් ඩස් ඉට් (ඩසිට්) මීන් ?
මොකක්ද එකෙන් අදහස් කරන්නෙ ? (ඒකෙ තේරුම මොකක්ද ?) (mean - අදහස් කරනවා)

What does it mean by “junk food”?
වට් ඩස් ඉට්( ඩසිට්) මීන් බයි ජංක් ෆුඩ් ?
‘ජංක් ෆුඩ්’ කියන එකෙන් අදහස් කරන්නෙ මොකක්ද?

What does this word mean?
වට් ඩස් දිස් ව(ර්)ඩ් මීන් ?
මේ වචනෙන් අදහස් කරන්නේ මොකක්ද? (මේ වචනෙ තේරුම මොකක්ද )

Do you know what this word means ?
ඩූ යූ නෝ වට් දිස් වර්ඩ් මීන්ස් ?
ඔයා දන්නවද මේ වචනෙ තේරුම මොකක්ද කියලා ?

- ( මෙතනදී ඉහත What does this word mean ? කියන ප්‍රශ්නයට Do you know කියන ප්‍රශ්නය ?එකතු වෙලා තියෙනවා. ඉංග්‍රීසි භාෂාවේ මේ විදියට ප්‍රශ්න දෙකක් එක ලඟ එකට ඇලිලා ඉන්නෙ නැහැ. අනිවාර්යයෙන්ම දෙවනියට එන ප්‍රශ්නයේ ප්‍රශ්න රූපය නැති වෙලා එය සාමාන්‍ය වාක්‍යයක රූපය ගන්නවා )

Does she always get angry ?
ඩස් ෂී ඕල්වේස් ගෙට් ඇංග්‍රි ?
ඇය නිතරම කේන්ති ගන්නවද ?

Does it work properly ?
ඩස් ඉට් ව(ර්)ක් ප්‍රොප(ර්)ලි ?
ඒක හරියට වැඩ කරනවද ?

Do your friends know the way here ?
ඩූ යුව(ර්) ෆ්‍රෙන්ඩ්ස් නෝ ද වේ හියර(ර්) ?
ඔයාගේ යාලුවෝ දන්නවද මෙහෙ එන පාර ?

Why does she always get angry ?
වයි ඩස් ෂී ඕල්වේස් ගෙට් ඇංග්‍රි ?
ඇයි ඇය නිතරම කේන්ති ගන්නෙ ?

Do you know about him ?
ඩූ යූ නෝ අබවුට් හිම් ?
ඔයා ඔහු ගැන දන්නවද ?

Do they make noise ?
ඩූ දේ මේක් නොයිස් ?
ඔවුන් සද්ද කරනවද ?

How do you know about him ?
හවු ඩු යූ නෝ අබවුට් හිම් ?
ඔයා කොහොමද ඔහු ගැන දන්නෙ ?

Do they disturb you ?
ඩූ දේ ඩිස්ට(ර්)බ් යූ ?
ඔවුන් ඔබට බාධා කරනවද ?

How much do I owe you?
හව් මච් ඩු අයි ඕ යූ ?
මම ඔයාට කොච්චර ණයද? (කීයක් දෙන්න තියෙනවද?)

How much do they charge?
හවු මච් ඩු දේ චා(ර්)ජ් ?
ඔවුන් කොපමණ අය කරනවද?

He comes here once in a while
හී කම්ස් හිය(ර්) වන්ස් ඉන් අ වයිල්
ඔහු මෙහෙ එනවා ඉඳල හිටලා
(Once in a while - ඉදලා හිටලා)

She rarely goes out nowadays
ෂී රෙයා(ර්)ලි ගෝස් අවුට් නව්අඩේස්
ඇය කලාතුරකින් එලියට යන්නෙ මේ දවස්වල (Rarely - කලාතුරකින්) (nowadays-මේ දවස්වල)

He usually calls me if he gets late
හී යූෂුවලි කෝල්ස් මී ඉෆ් හී ගෙට්ස් ලේට්
ඔහු සාමාන්‍යයෙන් මට කෝල් කරනවා ඔහු පරක්කු වෙනව නම් (if - නම් ..වුවහොත් … යන අදහස දෙන සම්බන්ධක පදයක්)

It breaks down very often
ඉට් බ්‍රේක්ස් ඩවුන් වෙරි ඕෆ්න්
ඒක නිතරම කැඩෙනවා (යන්ත්‍රයක් , වාහනයක් වැනි ) (break down - බිඳ වැටෙනවා , කැඩෙනවා )

Lesson 9 **Spoken English**

මීලගට Spoken English පාඩමෙන් අපි බලමු සමාව ඉල්ලන්නේ කොහොමද කියල . මෙයත් පුද්ගලයෙකුගේ වැදගත් කම , සීලාචාර ආකල්පය පෙන්වන, හඟවන ලකුණක් . අපි මුලින්ම බලමු ඉංග්‍රීසියෙන් සමාව ඉල්ලන්න භාවිතා වෙන වැකි මොනවද කියලා

I am sorry - අයෑම් සොරි - මට කණගාටුයි / මට සමාවෙන්න

I am so sorry - අයෑම් සෝ සොරි - මට බෙහෙවින්ම කණගාටුයි / මම ගොඩක් සමාව ඉල්ලනවා

I am very sorry - අයෑම් වෙරි සොරි - මට බෙහෙවින්ම කණගාටුයි/ මම ගොඩක් සමාව ඉල්ලනවා

I am really sorry - අයම් රියලි සොරි - මට ඇත්තටම කණගාටුයි/ මම ඇත්තටම සමාව ඉල්ලනවා

I am extremely sorry - අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි - මට අතිශයින්ම කණගාටුයි/ මම බෙහෙවින්ම සමාව ඉල්ලනවා

Sorry about that - සොරි අබවුට් දැට් - ඒ ගැන සමාවෙන්න

I am sorry for ……. - අයෑම් සොරි ෆෝ ……… - ……….(සදහා ) සමා වන්න

I apologize for ……. - අයි ඇපොලොජයිස් ෆෝ ………. - මම සමාව ඉල්ලනවා …………(සදහා )

අපි බලමු උදාහරණ

I’m sorry, I stepped on your foot

අයෑම් සොරි, අයි ස්ටෙප්ඩ් ඔන් යුව(ර්) ෆුට්

මට සමාවෙන්න , මම ඔයාගේ කකුල පෑගුවා

I am sorry,  I dropped your pencil.

අයෑම් සොරි , අයි ඩ්‍රොප්ඩ් යුව(ර්) පෙන්සිල්

මට සමාවෙන්න , මම ඔයාගේ පැන්සල  වැට්ටුවා

I'm so sorry, I didn't see you there.

අයෑම් සෝ සොරි, අයි ඩිඩන්ට් සී යූ දෙයා

මට බෙහෙවින්ම සමාවෙන්න, මට ඔයා එතන ඉන්නවා දැක්කේ නෑ

I'm very sorry, I forgot to bring your book back.

අයෑම් වෙරි සොරි, අයි ෆොගොට් ටු බ්‍රිං යුව(ර්) බුක් බැක්

මම ගොඩක් සමාවෙන්න , මට ඔයාගේ පොත ආපහු ගේන්න බැරි වුනා

I am really sorry, I took your pen by mistake.

අයෑම් රියලි සොරි, අයි ටුක් යුව(ර්) පෙන් බයි මිස්ටේක්

මට ඇත්තටම කනගාටුයි, මම වැරදිලා ඔයාගේ පෑන ගත්තා

I am extremely sorry. It was a mistake

අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි. ඉට්  වෝස්  අ මිස්ටේක්

මට අතිශයින්ම කනගාටුයි/ මම බෙහෙවින්ම සමාව ඉල්ලනවා . ඒක  අත් වැරද්දක්

I am really sorry for my mistake

අයෑම් සොරි ෆෝ මයි මිස්ටේක්

මට ඇත්තටම් කනගාටුයි මගෙන් වෙච්චි වැරැද්දට

I'm really sorry for breaking your toy

අයෑම් සොරි ෆෝ බ්‍රේකින් යුව(ර්) ටෝයි

මට ඇත්තටම් සමාවෙන්න ඔයාගේ සෙල්ලම් බඩුව කැඩුවට

I am really sorry for what happened

අයෑම් රියලි  සොරි ෆෝ වට් හැපන්ඩ්

මට ඇත්තටම කනගාටුයි වෙච්ච් දේට / මට ඇත්තටම සමා වෙන්න වෙච්ච් දේට

I’m sorry for losing your eraser.

අයෑම් සොරි ෆෝ ලූසිං යුව(ර්) ඉරේස(ර්)

ඔයාගේ මකනේ නැති කලාට මට සමාවෙන්න

Sorry for taking your seat.

සොරි ෆෝ ටේකිං යුව(ර්) සීට්

ඔයාගේ සීට්  එක ගත්තට මට සමාවෙන්න

Sorry for taking too much time

සොරි ෆෝ ටේකිං ටූ මච් ටයිම්

ගොඩාක් වෙලාව ගත්තට සමාවෙන්න

I am sorry for troubling you

අයෑම්  සොරි ෆෝ ට්‍රබලිං යූ

ඔයාට කරදර කලාට සමාවෙන්න

I touched it by mistake. Sorry about that.

අයි ටච්ට් ඉට් බයි මිස්ටේක්. සොරී අබවුට් දැට්.

මම වැරදිල ඒක ටච් කලේ. ඒකට සොරි. (touch - ස්පර්ශ කරනවා , අල්ලනවා )

I am sorry for my mistake

අයෑම් සොරි ෆෝ මයි මිස්ටේක්

මගේ අත් වැරැද්දට සමාවෙන්න

I am sorry for the delay

අයෑම් සොරි ෆෝ ද ඩිලේ

ප්‍රමාදයට මට සමාවෙන්න

Sorry for the trouble

සොරි ෆෝ ද ට්‍රබල්

කරදරයට සමාවෙන්න

Sorry for the noise

සොරි ෆෝ ද නොයිස්

සද්දෙට සමාවෙන්න

I apologize for his behaviour.

අයි ඇපොලොජයිස් ෆෝ හිස් බිහේවිය(ර්)

ඔහුගේ හැසිරීම ගැන මම සමාව අයදිනවා

I apologize for the misunderstanding

අයි ඇපොලොජයිස් ෆෝ ද මිස්අන්ඩස්ටෑන්ඩිං

වැරදි වටහා ගැනීම ගැන මම සමාව අයදිනවා

- යාළුවෝ ,මිත්‍රයෝ , පව්ලේ අය අතර වගේ නම්, මේ වගේ කෙටියෙන් සමාව ගන්නත් පුළුවන්

Sorry, I was late.

සොරි, අයි වෝස් ලේට්

සමාවෙන්න, මම පරක්කු වුනා

Sorry, I forgot it

සොරි , අයි ෆොගොට් ඉට්

සමාවෙන්න, මට ඒක අමතක වුනා

Sorry, I spilled the water.

සොරි, අයි ස්පිල්ඩ් ද වෝට(ර්)

සමාවෙන්න, මම වතුර ඉහිරුවා

Sorry , I did it by mistake

සොරි , අයි ඩිඩ් ඉට් බයි මිස්ටේක්

සමාවෙන්න , මම වැරදීමකින් ඒක කලේ

ඉංග්‍රීසි භාෂාවේදී ස්තුතිය පල කලාම ඒයට ප්‍රතිචාරයක් දක්වනවා වගේම , සමාව ඉල්ලුවමත් ඒයට ප්‍රතිචාරයක් දක්වනවා. මෙය ඔවුන්ගේ සංස්කෘතියේ තියෙන වැදගත් ලක්ෂණයක්. අපි බලමු කොහොමද සමාව ඉල්ලීමකට ප්‍රතිචාර දක්වන්නේ කියලා. මේ තියෙන්නේ ඒ වගේ සමාවකට ප්‍රතිචාර දක්වන විධි කිහිපයක්

It’s okay - ඉට්ස් ඕකේ - ඒක කමක් නැහැ

No problem ! - නෝ ප්‍රොබ්ලම් - ප්‍රශ්නයක් නැහැ

Don’t worry about it - ඩෝන්ට් වොරි අබවුට් ඉට් - ඒ ගැන කණගාටු වෙන්න එපා

That’s all right - දැට්ස් ඕල් රයිට් - ඒක  කමක් නැහැ

It’s fine - ඉට්ස් ෆයින් - ඒක  කමක් නැහැ

Never  mind - නෙව(ර්) මයින්ඩ් - ගානක් නෑ /කමක් නෑ

No worries- නෝ වොරීස් - කණගාටු වෙන්න එපා / ඒක  කමක් නෑ.

That’s okay - දැට්ස් ඕකේ - ඒක කමක් නෑ.

Forget it - ෆොගෙට් ඉට් - ඒක  අමතක කරන්න

No harm done - නෝ හාම් ඩන් - කිසිම හානියක් වුනේ නැහැ

අපි දැන් සමාව ඉල්ලන සහ එයට ප්‍රතිචාර දක්වන උදාහරණ ඇතුලත් කෙටි සංවාද කිහිපයක් ගෙන  බලමු

Dialogue 1

A :  I’m sorry, I stepped on your foot
අයෑම් සොරි, අයි ස්ටෙප්ඩ් ඔන්  යුව(ර්) ෆුට්
මට සමාවෙන්න , මම ඔයාගේ කකුල පෑගුවා

B :  It’s okay, it didn’t hurt.
ඉට්ස් ඕකේ . ඉට්  ඩිඩ්න්ට්  හ(ර්)ට්
ඒක  කමක් නැහැ . ඒක  රිදුනේ නැහැ

Dialogue  2

A :   I am sorry,  I dropped your pencil.
අයෑම් සොරි , අයි ඩ්‍රොප්ඩ් යුව(ර්) පෙන්සිල්
මට සමාවෙන්න , මම ඔයාගේ පැන්සල  වැට්ටුවා

B :   No problem, I have another one.

නෝ  ප්‍රොබ්ලම් , අයි හෑව් අනද(ර්) වන්

ප්‍රශ්නයක් නෑ  , මට තව එකක් තියෙනවා

Dialogue 3

A: :  I'm very sorry, I forgot to bring your book back.

අයෑම් වෙරි සොරි, අයි ෆොගොට් ටු බ්‍රිං යුව(ර්) බුක් බැක්

මම ගොඩක්ම  සමාවෙන්න , මට ඔයාගේ පොත ආපහු ගේන්න බැරි වුනා

B:   That's all right, just bring it tomorrow.

දැට්ස් ඕල්  රයිට් , ජස්ට් බ්‍රින් ඉට්  ටුමෝරෝ

ඒක  කමක් නැහැ , හෙට ගේන්නකෝ

Dialogue 4

A :  I'm really sorry for breaking your toy

අයෑම් රියලි සොරි ෆෝ බ්‍රේකින් යුව(ර්) ටෝයි

මට ඇත්තටම සමාවෙන්න ඔයාගේ සෙල්ලම් බඩුව කැඩුවට

B :  It's okay. We can fix it.

ඉට්ස් ඕකේ .වී කැන් ෆික්ස් ඉට්

ඒක  කමක් නැහැ . අපිට ඒක  හදා ගන්න පුළුවන්

Dialogue 5

A: I am really sorry for my mistake

අයෑම් සොරි ෆෝ මයි මිස්ටේක්

මට ඇත්තටම් කනගාටුයි මගෙන් වෙච්චි අත් වැරැද්දට

B: That's all right. It happens.

දැට්ස් ඕල් රයිට් . ඉට් හැපන්ස්

ඒක කමක් නැහැ .එහෙම වෙනවා

Dialogue 6

A: I am extremely sorry. It was a mistake

අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි. ඉට් වෝස් අ මිස්ටේක්

මට අතිශයින්ම කනගාටුයි/ මම බෙහෙවින්ම සමාව ඉල්ලනවා . ඒක අත් වැරද්දක්

B: Don't worry about it

ඩෝන්ට් වොරි අබවුට් දැට්

ඒ ගැන කනගාටු වෙන්න එපා

Dialogue 7

A: I am really sorry for what happened

අයෑම් රියලි සොරි ෆෝ වට් හැපන්ඩ්

මට ඇත්තටම කනගාටුයි වෙච්චි දේට / මට ඇත්තටම සමා වෙන්න වෙච්චි දේට

B: That's okay, Forget about it

දැට්ස් ඕකේ . ෆොගෙට් අබවුට් ඉට්

ඒක කමක් නැහැ . ඒක අමතක කරන්න

Dialogue 8

A: Sorry, I was late.

සොරි, අයි වෝස් ලේට්

සමාවෙන්න, මම පරක්කු වුනා

B: It's all right. Try to be punctual next time

ඉට්ස් ඕල් රයිට් . ට්‍රයි ටු බී පංක්චුවල් නෙක්ස්ට් ටයිම්

ඒකට කමක් නැහැ . ඊලග පාර වෙලාවට වැඩ කරන්න උත්සාහ කරන්න
(punctual – පංක්චුවල් - වේලාවට වැඩ කරන )

Dialogue 9

A: Sorry, I forgot it

සොරි , අයි ෆොගොට් ඉට්

සමාවෙන්න, මට ඒක අමතක වුනා

B: No problem. I'll get another one.

නෝ ප්‍රොබ්ලම්. අයිල් ගෙට් අනද(ර්) වන්

ප්‍රශ්නයක් නෑ , මම වෙන එකක් ගන්නම්

Dialogue 10

A : I’m sorry for losing your eraser.

අයෑම් සොරි ෆෝ ලූසිං යුව(ර්) ඉරේස(ර්)

ඔයාගේ මකනේ නැති කලාට මට සමාවෙන්න

B : Don’t worry . I have another

ඩෝන්ට් වොරි , අයි හෑව් අනද(ර්)

කනගාටු වෙන්න එපා , මට වෙන එකක් තියෙනවා

Dialogue 11

A: Sorry for taking your seat.

සොරි ෆෝ ටේකිං යුව(ර්) සීට්

ඔයාගේ සීට් එක ගත්තට මට සමාවෙන්න

B: That’s okay, I’ll sit somewhere else.

දැට්ස් ඕකේ , අයිල් සිට් සම්වෙයා එල්ස්

කමක් නැහැ , මම වෙන තැනක ඉඳ ගන්නම්

Dialogue 12

A : Sorry for taking too much time

සොරි ෆෝ ටේකිං ටූ මච් ටයිම්

ගොඩාක් වෙලාව ගත්තට සමාවෙන්න

B : Never mind ! We have enough time

නෙව(ර්) මයින්ඩ් ! වී හෑව් ඉනෆ් ටයිම්

කමක් නැහැ . අපිට වෙලාව තියෙනවා

Dialogue 13

A: Sorry for spilling water here

සොරි ෆෝ ස්පිලිං වෝට(ර්) හියර(ර්)

මෙතැන් වතුර ඉහිරුවට මට සමාවෙන්න

B : Don't worry . Let's clean it up.

ඩෝන්ට් වොරි . ලෙට්ස් ක්ලීන් ඉට් අප්

කණගාටු වෙන්න එපා . අපි ඒක සුද්ද කරමු

Dialogue 14

A : I am sorry for hurting your feelings

අයෑම් සොරි ෆෝ හ(ර්)ටිං යුව(ර්) ෆීලින්ස්

ඔයාගේ හිත රිද්දුවට මට සමාවෙන්න

B : That's all right. Forget it

දැට්ස් ඕල් රයිට් . ෆොගෙට් ඉට්

ඒක කමක් නැහැ , ඒක අමතක කරන්න

Dialogue 15

A : Sorry for disturbing you. I didn't know you are in some work

සොරි ෆෝ ඩිස්ට(ර්)බිං යූ. අයි ඩිඩ්න්ට් නෝ යූ ආ ඉන් සම් ව(ර්)ක්

ඔයාට බාධා කලාට සමාවෙන්න. මම දැනන් හිටියේ නැහැ ඔයා යම් වැඩක කියලා

B: It's all right. I am almost finished

ඉට්ස් ඕල් රයිට්. අයෑම් ඕල්මොස්ට් ෆිනිශ්ඩ්

කමක් නෑ. මම ඉවර වෙන්න ඔන්න මෙන්න

Dialogue 16

A: I'm so sorry, I misplaced your key.

අයෑම් සෝ සොරි, අයි මිස්ප්ලේස්ඩ් යුව(ර්) කී

මට හරිම කනගාටුයි , මම ඔයාගේ යතුර නැති කලා

B: It's fine. We'll find it.

ඉට්ස් ෆයින්. වී විල් ෆයින්ඩ් ඉට්

කමක් නෑ. අපි ඒක හොයාගමු.

Dialogue 17

A: I'm extremely sorry, I sent the wrong file.

අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි, අයි සෙන්ට් ද රෝං ෆයිල්.

මට අතිශයින්ම කණගාටුයි, මම වැරදි ෆයිල් එක යැව්වේ

B: That's okay . Just resend it.

දැට්ස් ඕකේ . ජස්ට් රීසෙන්ඩ් ඉට්.

කමක් නෑ. ඒක ආපහු යවන්න.

Dialogue 18

A: Sorry for misunderstanding the instructions.

සොරි ෆෝ මිස්අන්ඩස්ටෑන්ඩිං ද ඉන්ස්ට්‍රක්ෂන්ස්.

උපදෙස් වැරදියට තේරුම් ගත්තට මට සමාවෙන්න

B: No worries. It happens.

නෝ වොරීස්. ඉට් හැපන්ස්.

කමක් නෑ. එහෙම වෙනවා

Dialogue 19

A: I apologize for my mistake. It was unintentional.

අයි ඇපොලොජයිස් ෆෝ මයි මිස්ටේක්. ඉට් වෝස් අන්ඉන්ටෙන්ෂනල්.

මගෙන් වෙච්ච අත් වැරැද්දට මම සමාව ඉල්ලනවා. ඒක හිතලා කරපු දෙයක් නෙවෙයි

B: No harm done. Don't worry about it.

නෝ හාම් ඩන්. ඩෝන්ට් වොරි අබවුට් ඉට්.

කිසිම හානියක් වුනේ නැහැ . ඒ ගැන තැවෙන්න එපා.

Dialogue 20

A: I am sorry, I forgot to bring your book.

අයෑම් සොරි, අයි ෆොගොට් ටු බ්‍රිං යුව(ර්) බුක්.

මට සමාවෙන්න, ඔයාගේ පොත අරන් එන්න මට අමතක වුණා.

B: Never mind, you can bring it tomorrow.

නෙව(ර්) මයින්ඩ්, යූ කැන් බ්‍රිං ඉට් ටුමෝරෝ.

කමක් නෑ, ඔයාට හෙට ඒක අරගෙන එන්න පුළුවන්

Dialogue 21

A: I am extremely sorry, I had sent the parcel to another person by mistake.

අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි, අයි හෑඩ් සෙන්ට් ද පා(ර්)සල් ටු අනද(ර්) ප(ර්)සන් බයි මිස්ටේක්.

මට ඉතාමත්ම සමාවෙන්න, මම වැරදීමකින් පාර්සල් එක වෙන කෙනෙකුට යවලා තිබුනා

B: That's alright, it happens sometimes. You should be more careful in future

දැට්ස් ඕල්රයිට්, ඉට් හැපන්ස් සම් ටයිම්ස්. යූ ශුඩ් බී මෝ කෙයාෆුල් ඉන් ෆියුච(ර්)

කමක් නෑ, සමහර වෙලාවට එහෙම වෙනවා. ඔයා ඉදිරියේදී වඩාත් ප්‍රවේශම් වෙන්න

Dialogue 22

A: Oh, sorry, I dropped it and it broke into pieces.

ඔහ්, සොරි, අයි ඩ්‍රොප්ඩ් ඉට් ඇන්ඩ් ඉට් බ්‍රෝක් ඉන්ටු පීසස්.

අයියෝ, සමාවෙන්න, මම ඒක අත ඇරියා ,ඒක කෑලි වලට කැඩුනා

B: Forget it. We can buy a new one.

ෆොගෙට් ඉට්. වී කැන් බයි අ නිව් වන්.

ඒක  අමතක කරන්න. අපිට අලුත් එකක් ගතහැකි

Dialogue 23

A: Oh, sorry for bumping into you ! Did it hurt?

ඕහ්, සොරි ෆෝ බම්පිං ඉන්ටු යූ ! ඩිඩ් ඉට් (ඩිඩිට්) හ(ර්)ට් ?

අයියෝ, ඔයාගෙ ඇඟේ හැපුනට සමාවෙන්න ! ඒකෙන්  රිදුනද ? (ඔයාට රිදුනද ?)

B: It's okay, Not at all.

ඉට්ස් ඕකේ, නෝට් ඇට් ඕල්.

කමක් නෑ, කොහෙත්ම නැහැ (කොහෙත්ම රිදුනේ නැහැ )

Dialogue 24

A: Oops ! Sorry, I touched the wrong button and it malfunctioned.
උප්ස් ! සොරි, අයි ටච්ඩ් ද රෝං  බටින් ඇන්ඩ් ඉට් මැල්ෆංක්ෂන්ඩ්.
අයියෝ ! සමාවෙන්න, මම වැරදි බටන් එක(ස්විච් එක )එබුවේ . ඒක වැඩ කරන් නැතුව ගියා (malfunction - වැඩ කරන් නැතුව යනවා)

B: No worries, we can correct it.
නෝ වොරීස්, වී කැන් කරෙක්ට් ඉට්.
කමක් නෑ, අපිට ඒක නිවැරදි කරන්න පුළුවන්.

Dialogue 25

අපි හිතමු කාර්යාලයේ වැඩ කරමින් ඉන්න අතරතුර ඔබ අතින් ඉතා කුඩා වරදක් වෙනවා කියලා

A :- Oh, sorry about that

ඕහ්, සොරි අබවුට් දැට්

ඕහ් … ඒ ගැන කනගාටුයි / සමාවන්න

B :- That's all right / never mind

දැට්ස් ඔල් රයිට් / නෙවර් මයින්ඩ්

ඒක කමක් නෑ / ගානක් නෑ (මෙම ප්‍රතිචාර දෙකින් එකක් ලබා දිය හැකියි)

Dialogue 26

සමහරවිට යම් අතපසුවීමක් සිදු වුනේ ඔබේ වරදින් බව පිළිගැනීමට ඔබට අවශ්‍යයි.

A :- Oh, I am sorry, It's my fault

ඕහ්, අයෑම් සොරි, ඉට්ස් මයි ෆෝල්ට්

මට සමාවෙන්න, ඒක මගේ වරද

B :- Don’t worry about that

ඩෝන්ට් වොරි අබවුට් දැට්

ඒ ගැන කණගාටු වෙන්න එපා

Dialogue 27

ඇතැම් විට ඔබ යම් තැනකට යන්න පමා වෙනවා. දැන් ඔබ කියන්නෙ ඔබේ වරදක් නොවන හේතුවක්

A :- I am sorry, I am late, I got caught up in the traffic jam

අයෑම් සොරිල අයෑම් ලේට්, අයි ගොට් කෝට් අප්(කෝටප්) ඉන් ද ට්‍රැෆික් ජෑම්

සමාවෙන්න මම පරක්කුයි. මාව ට්‍රැෆික් ජෑම් එකට අහුවුනා

B :- It's not your fault

ඉට්ස් නොට් යුව(ර්) ෆෝල්ට්

ඒක ඔයාගේ වරදක් නෙමෙයි

Dialogue 28

ඇතැම් විට ඔබට කියන්න අවශ්‍යයි ඔබ ඒ දෙය කිරීමට අදහස් නොකළ බව

A :- Sorry I didn't mean to do that

සොරි අයි ඩිඩින්ට් මීන් ටූ ඩු දැට්

සමාවෙන්න, මම ඒක කරන්න අදහස් කළේ නෑ (මම ඒක හිතලා කරපු දෙයක් නෙමෙයි)

B :- That's all right / never mind

දැට්ස් ඔල් රයිට් / නෙව(ර්) මයින්ඩ්

ඒක කමක් නෑ / ගානක් නෑ

Dialogue 29

ඇතැම් විට එය සිදුවුණේ අත්වැරදීමකින් නම්

A :- Sorry, it was a mistake

සොරී ඉට් වෝස් අ මිස්ටේක්

සමාවෙන්න, එක වැරදීමක්

B :- Don’t worry, not your fault

ඩොන්ට් වොරි, නොට් යුව(ර්) ෆෝල්ට්

කනගාටු වෙන්න එපා. ඔයාගෙ වරද නෙමෙයි

Dialogue 30

A :- Oh sorry, I have taken your pen

ඔහ් සොරි, අයි හෑව් ටේකන් යුව(ර්) පෙන්

සමාවෙන්න, මම ඔයාගෙ පෑන අරගෙන (වැරදීමකින් විය හැකියි )

B :- No big thing

නෝ බිග් තිං

ලොකු දෙයක් නෙවෙයි./ඕක මහ ලොකු දෙයක්ද? (සමාව ඉල්ලන්න තරම්)

Dialogue 31

A :- I am sorry, I didn't know it was yours

අයෑම් සොරි, අයි ඩිඩ්න්ට් නෝ ඉට් වෝස් යුව(ර්)ස්

මට සමාවෙන්න, මම දැනං හිටියෙ නෑ ඒක ඔයාගෙ කියලා

B :- Forget it

ෆොගෙට් ඉට්

ඒක අමතක කරන්න

තවත් සමාව ඉල්ලීම් කිහිපයක්

Dialogue 32

A: Sorry for keeping you waiting.
සොරි ෆෝ කීපින් යූ වේටිං.
ඔයාව බලන් ඉන්න සැලැස්සුවට (ඔයාව රස්තියාදු කලාට ) සමා වෙන්න

B: It doesn't matter. It wasn't a long time.
ඉට් ඩසන්ට් මැට(ර්). ඉට් වොස්න්ට් අ ලෝං ටයිම්.
ඒකට කමක් නෑ. ඒක එච්චර ලොකු වෙලාවක් නෙවෙයි

Dialogue 33

A: Sorry for taking too long
සොරි ෆෝ ටේකිං ටූ ලෝං
ගොඩාක් වෙලා ගත්තට සමාවෙන්න (take long කියන්නේ ගොඩක් වෙලාව ගන්නවා)

B: It’s alright. We have enough time
ඉට්ස් ඕල්රයිට්. වී හෑව් ඉනෆ් ටයිම්
ඒකට කමක් නෑ. අපිට ප්‍රමාණවත් වෙලාව තියෙනවා

Dialogue 34

A: Sorry for being unable to do it now
සොරි ෆෝ බීන් අනේබල් ටු ඩූ ඉට් නව්
ඒක දැන් කරන්න බැරි වුනාට සමාවෙන්න

B: Don’t worry. I will try someone else
ඩෝන්ට් වොරි. අයි විල් ට්‍රයි සම්වන් එල්ස්
කණගාටු වෙන්න එපා. මම වෙන කෙනෙක්ව උත්සාහ කර බලන්නම්

Dialogue 35

A: Sorry for being unable to help you in this case
සොරි ෆෝ බීන් අනේබල් ටු හෙල්ප් යූ ඉන් දිස් කේස්
මේ කාරණයේදී ඔයාට උදව් කරන්න බැරි වීම ගැන කනගාටුයි

B: Don’t worry. I perfectly understand.
ඩෝන්ට් වොරි. අයි ප(ර්ෆෙක්ට්ලි අන්ඩස්ටෑන්ඩ්.
කනගාටු වෙන්න එපා. මට සම්පූර්ණයෙන්ම වැටහෙනවා (එය කරන්න ඔබේ නොහැකියාව මට සම්පූර්ණයෙන් වැටහෙනවා ).

Dialogue 36

A: Sorry for not calling you
සොරි ෆෝ නොට් කෝලිං යූ
ඔයාට කෝල් නොකරපු එකට සමාවෙන්න

B: No problem, I know you are busy
නෝ ප්‍රොබ්ලම්, අයි නෝ යූ ආ බිසී
කමක් නෑ. ඔයා බිසි කියලා මම දන්නවා

Dialogue 37

A: Sorry for the misunderstanding
සොරී ෆෝ ද මිස්අන්ඩස්ටෑන්ඩිං
වරදවා වටහා ගැනීමට සමාවෙන්න

B: Don’t think about it. Misunderstandings happen
ඩෝන්ට් තිංක් අබවුට් ඉට්. මිස්අන්ඩස්ටෑන්ඩිංස් හැපන්
ඒක ගැන හිතන්න එපා. වැරදි වැටහීම් සිද්ධ වෙනවා

Dialogue 38

A: Sorry for not being able to come to your wedding. My father fell ill
සොරී ෆෝ නොට් බීන් ඒබල් ටු කම් ටු යුව(ර්) වෙඩිං. මයි ෆාද(ර්) ෆෙල් ඉල්
ඔයාගේ විවාහයට එන්න බැරි වුනු එකට සමාවෙන්න. මගේ තාත්තා අසනීප වුණා

B: Don’t worry. It’s not your fault
ඩෝන්ට් වොරී. අයි නෝ ඉට්ස් නොට් යුව(ර්) ෆෝල්ට්
කණගාටු වෙන්න එපා . ඒක ඔයාගෙ වරදක් නෙවෙයි

Dialogue 39

A: I am very sorry. I couldn’t come on time because of the bus strike
අයෑම් වෙරි සොරි. අයි කුඩන්ට් කම් ඔන් ටයිම් බිකෝස් ඔෆ් ද බස් ස්ට්‍රයික්
මම සමාවෙන්න . බස් වර්ජනය නිසා මට වේලාවට එන්නම බැරි උනා

B: That’s alright. I know it’s not your fault
දැට්ස් ඕල්‍ර්‍රයිට්. අයි නෝ ඉට්ස් නොට් යුව(ර්) ෆෝල්ට්
කමක් නෑ. ඒක ඔයාගෙ වැරැද්ද නෙවෙයි කියලා දන්නවා

Dialogue 40

A I am sorry for disappointing you. I cannot do it now
අයෑම් සොරි ෆෝ ඩිසපොයින්ටිං යූ. අයි කැනොට් ඩූ ඉට් නව්
මට කණගාටුයි ඔයාගේ බලාපොරොත්තු බින්දට. මට දැන් ඒක කරන්න බෑ
( disappoint - ඩිසපොයින්ට්- බලාපොරොත්තු කඩ කරනවා )

B: That’s okay , Don’t think about it
දැට්ස් ඕකේ , ඩෝන්ට් තිංක් අබවුට් ඉට්
ඒක කමක් නෑ . ඒ ගැන හිතන්න එපා

**Vocabulary 9**

Bread – බ්‍රෙඩ් – පාන්

Light – ලයිට් – සැහැල්ලු

Light meal - ලයිට් මීල් - සැහැල්ලු ආහාර වේල

Belong – බිලෝං – අයත් වෙනවා

Own – ඕන් – අයිති වෙනවා

Estate – එස්ටේට් – වත්ත / දේපළ

Land – ලෑන්ඩ් – ඉඩම

Rain hard – රේන් හාඩ් – තදින් වහිනවා

Charge – චාජ් – ගාස්තු අය කරනවා

Get up – ගෙට් අප් – නැගිටිනවා , ඇඳෙන් නැගිටිනවා

wake up - වේක් අප් - අවදි වෙනවා , නින්දෙන් නැගිටිනවා

Look – ලුක් – බලනවා

Look like – ලුක් ලයික් – වගේ පේනවා

Grow – ග්‍රෝ – වර්ධනය වෙනවා , වැඩෙනවා

Day by day – ඩේ බයි ඩේ – දිනෙන් දින

Lie – ලයි – බොරු කියනවා

Lie – ලයි – ඇලවෙනවා , වැතිරෙනවා

Cheat – චීට් – වංචා කරනවා

Understand – අන්ඩස්ටෑන්ඩ් – තේරුම් ගන්නවා

Why – වයි – ඇයි

Properly – ප්‍රොප(ර්)ලි – නිසි ලෙස

Boss – බොස් – ප්‍රධානියා , ලොක්කා

Allow – අලව් – ඉඩ දෙනවා

Leave – ලීව් – පිටව යනවා , හැර යනවා , දාල යනවා

Think – තිංක් – හිතනවා

Hear – හියු(ර්) – ඇහෙනවා

Listen – ලිස්න් – ඇහුම්කන් දෙනවා

Machine – මැෂීන් – යන්ත්‍රය

Nowadays – නව්අඩේස් – මේ දවස්වල

Intend – ඉන්ටෙන්ඩ් – අදහස් කරනවා

Sell – සෙල් – විකුනනවා

Buy – බයි – මිලදී ගන්නවා

Believe – බිලීව් – විශ්වාස කරනවා

Care – කෙයා – සැලකිලිමත් වෙනවා , සලකනවා , ගණන් ගන්නවා

Others – අද(ර්)ස් – අනෙක් අය

Say – සේ – කියනවා

Stay up – ස්ටේ අප් – නොනිදා ඉන්නවා , අවදිව ඉන්නවා

Know – නෝ – දන්නවා

Recommend – රෙකමෙන්ඩ් – නිර්දේශ කරනවා

Incident – ඉන්සිඩන්ට් – සිද්ධිය

Often – ඕෆ්න් – නිතරම

Contain – කන්ටේන් – අඩංගු වෙනවා

Valuable – වැල්යුබල් – වටිනා

Information – ඉන්ෆොමේෂන් – තොරතුරු

Jewellery – ජුවල්රි – ආභරණ

Consist – කන්සිස්ට් – සමන්විත වෙනවා

Part – පාට් – කොටස

Mistake – මිස්ටේක් – වැරැද්ද

Face – ෆේස් – මුහුණ දෙනවා

Difficulty – ඩිෆිකල්ටි – අපහසු, අමාරු

Because – බිකෝස් – නිසා

Get late – ගෙට් ලේට් – ප්‍රමාද වෙනවා

Never – නෙව(ර්) – කවදාවත් නැහැ

Accept – ඇක්සෙප්ට් – පිළිගන්නවා

Fault – ෆෝල්ට් – දෝෂය

Anyone – එනිවන් – කවුරුහරි

Argue – ආගියු – තර්ක කරනවා

Mean – මීන් – අදහස් කරනවා

Junk – ජංක් – කුණු , නිෂ්ප්‍රයෝජන දේ

Junk food – ජන්ක් ෆුඩ් – කෙටි කෑම වර්ග

Word – ව(ර්)ඩ් – වචනය

Get angry – ගෙට් ඇංග්‍රි – කෝපයට පත් වෙනවා

Make noise – මේක් නොයිස් – ශබ්ද කරනවා

Owe – ඕ – නයට සිටිනවා

Once in a while – වන්ස් ඉන් අ වයිල් – කලාතුරකින්

Rarely – රෙයාලි – කලාතුරකින්

Extremely – එක්ස්ට්‍රීම්ලි – අතිශයින්

Apologize – අපොලජයිස් – සමාව ඉල්ලනවා

Step – ස්ටෙප් – පියවර, පියවර තබනවා

Foot – ෆුට් – පාදය

Forget – ෆොගෙට් – අමතක වෙනවා , අමතක කරනවා

Forgot – ෆොගොට් – අමතක වුණා

Toy – ටෝයි – සෙල්ලම් බඩුව

Touch – ටච් – ස්පර්ශ කරනවා

Delay – ඩිලේ – ප්‍රමාදය

Behaviour – බිහේවිය(ර්) – හැසිරීම

Misunderstanding – මිස්අන්ඩස්ටෑන්ඩිං – වරදවා තේරුම් ගැනීම

Spill – ස්පිල් – ඉහිරනවා, ඉහිරෙනවා

Harm – හාම් – හානි කරනවා , හානිය

Hurt – හ(ර්)ට් – රිද්දනවා , රිදෙනවා

Punctual – පංක්චුවල් – වේලාවට වැඩ කරන

Else – එල්ස් – වෙනත්

Somewhere – සම්වෙයා – කොහේ හරි

Disturb – ඩිස්ට(ර්)බ් – බාධා කරනවා

Misplace – මිස්ප්ලේස් – නැති වෙනවා , අස්ථාන ගත වෙනවා

Find – ෆයින්ඩ් – සොයාගන්නවා

Send – සෙන්ඩ් – යවනවා

Sent – සෙන්ට් – යැව්වා

Right – රයිට් – හරි

Wrong – රෝං – වැරදි

File – ෆයිල් – ගොනුව

Resend – රීසෙන්ඩ් – නැවත යවනවා

Instruction – ඉන්ස්ට්‍රක්ෂන් – උපදෙස

Intentional – ඉන්ටෙන්ෂනල් – හිතාමතාම කරන

Unintentional – අන්ඉන්ටෙන්ෂනල් – හිතාමතා නොකරන

Parcel – පා(ර්)සල් – පැකේජය

Person – ප(ර්)සන් – පුද්ගලයා

Careful – කෙයාෆුල් – සැලකිලිමත්

Careless - කෙයාලස් - නොසැලකිලිමත්

Break into pieces – බ්‍රේක් ඉන්ටු පීසස් – කැබලි වලට කැඩෙනවා

Bump into (someone )... – බම්ප් ඉන්ටු ...– (කාවහරි ) අහම්බෙන් හම්බ වෙනවා , කාගේ හරි , ඇගේ හැපෙනවා

Malfunction – මැල්ෆංක්ෂන් – නිසි ලෙස ක්‍රියා නොකරනවා , බිඳ වැටෙනවා

Worries – වොරීස් – දුක් , සාංකා , කනස්සලු

Correct – කරෙක්ට් – නිවැරදි

Get caught up in …. – ගෙට් කෝට් අප් ඉන් …. – (යමකට ) හසු වෙනවා

Able – ඒබල් – හැකියාව ඇති

Unable – අනේබල් – හැකියාව නැති

Perfectly – ප(ර්)ෆෙක්ට්ලි – සම්පූර්ණ ලෙස

Fall ill – ෆෝල් ඉල් – අසනීප වෙනවා

Fell ill – ෆෙල් ඉල් – අසනීප වුණා

Get ill - ගෙට් ඉල් - අසනීප වෙනවා

Strike – ස්ට්‍රයික් – වර්ජනය

Disappoint – ඩිසපොයින්ට් – බලාපොරොත්තු බිඳිනවා , කලකිරවනවා